# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 මැයි මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.05.08 දින නිකුත් කරන ලදී)

# පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත** සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන)

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මෙම පනත 2024 අංක      දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2009 අංක 58 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" ලෙස හඳුන්වනු ලබන) 7 වන වගන්තිය, එහි 4 (ඇ) උපවගන්තිය පරිච්ඡින්න කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මඟින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) දේශපාලන පක්ෂ තුළ හා දේශපාලනය තුළ වඩාත් යහපත් කාන්තා නියෝජනයක් සහතික කරනු පිණිස සෑම පිළිගත් දේශපාලන පක්ෂයකම නිලධාරි ලැයිස්තුව තුළ තීරණ ගැනීමේ ධාරිතාවයෙහි සියයට තිහකට නොඅඩු ප්‍රතිශතයක කාන්තා නියෝජනයක් ඇතුළත් කිරීමට ඒ ඒ දේශපාලන පක්ෂය විසින් සහතික කළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.